**ශීර්ෂය 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනසම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමෙන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිතහෙළිදරව්කිරීම් අගයන ලදි.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්,ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත්වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) මෙම වාර්තාවේ 1.6.1 (ආ),1.6.2 (අ), (ආ) , 1.6.4 (අ),(ආ),(ඇ) ,(ඉ) 2.2 ඡේදයන්හි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (අ) | අත්තිකාරම් ගිණුම් වට්නාකම්වලින් තැන්පතු ගිණුම් වට්නාකම් අඩු කිරීමෙන් ලැබෙන ශේෂය ශුද්ධ වත්කම් යටතේ ගැලපිය යුතු වුවත්, එසේ නොකිරීම හේතුවෙන් මුළු වත්කම්හා මුළු වගකීම් අතර වෙනස රු. 29,242,328 ක සෘණ අගයක් ශුද්ධ වත්කම් ලෙස දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් තැබිය යුතු වීම. | මූල්‍ය ප්‍රකාශනයෙහි කුලී වැඩ අත්තිකාරම් ශේෂ වෙනස්කම් කළ පසු විමසුමෙහි පෙන්වා ඇති වෙනස ඉවත් වන බවත්, 2020 දෙසැම්බර් 31 දිනට ගිණුමෙහි ආරම්භක ශේෂය නිවැරදි කිරීමට සටහන් කරගත් බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.1,930,408,065 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද ඊට අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එම වටිනාකම්වල නිරවද්‍යතාව තහවුරු නොවුණි. | මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව්කර ඇති වටිනාකම් තහවුරු කිරීම සඳහා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතු වීම. | තක්සේරු කර නොමැති ඉතිරි ගොඩනැගිලි තක්සේරුවෙන් පසු ඇතුළත් කිරීමෙන් පසුව හා අනෙකුත් සියලු වත්කම් වටිනාකම් 2020 දෙසැම්බර් 31 දිනට නිවැරදි කර ගිණුම්ගත කරන බව. |

**1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුමේ ශේෂයන් සමාන විය යුතුයි. එසේ වුවද, කුලී හා වැඩ අත්තිකාරම් ද්විත්ව සටහන් අනුව ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේගනුදෙනු නොමැති ලෙස හා කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුමේ රු. 32,332,805 ක ශේෂයක් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 250/2016 හා 2016 ජූනි 09 ප්‍රකාරව ගිණුම් තැබිය යුතු වීම. | විමසුම සම්බන්ධයෙන් එකඟ වන බවත්,<br><br>කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ ශේෂය 2020 අවසන් ගිණුම තුළ නිවැරදි කිරීම කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින්භාණ්ඩාගාර මාරු පත්‍ර අදාළ වර්ෂය තුළ ඉදිරිපත් කර නොතිබීම හා සමාලෝචිත වර්ෂයෙන් පසුව ඉදිරිපත් කරන ලද මාරුපත්‍ර සමාලෝචිත වර්ෂය සඳහා ගැලැපීමට කටයුතු කර තිබුණි. මේ හේතුවෙන් කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුමේ ආරම්භක ශේෂය සිගාස් වැඩසටහන අනුව රු. 27,387,159 වුවත් එය රු.26,039,146 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ අතර එහි අවසන් ශේෂය සිගාස් වැඩසටහන අනුව රු. 41,579,328 ක් වූවත් මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 32,332,805 ක් ලෙස පෙන්වා තිබුණි. මේ නිසා මූල්‍ය ප්‍රකාශන අනුව කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුමේ ආරම්භක හා අවසන් ශේෂ අතර පිළිවෙලින් රු. 1,348,013 ක් හා රු. 9,246,523 ක වෙනසක් නිරීක්ෂණය විය. | ශේෂයන් අතර වෙනසට හේතු පරික්ෂා කර නිවැරදි කිරීමට හා කාල පරිච්ඡේදය තුළ සිදු කළ ගනුදෙනු පමණක් මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂයට අදාළව 2019 වර්ෂයේ දී ද 2019 වර්ෂයට අදාළව 2020 වර්ෂයේ දීද මාරු පත්‍ර භාණ්ඩාගාරයට ඉදිරිපත් කර නිරවුල් කර ඇති බව. |

**1.6.3 විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විදුලි සෝපානය සවි කිරීම හා මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කර්මාන්ත 419 ක් ඉටු කිරීම වෙනුවෙන් එකතුව රු. 178,686,608 ක් වූ කොන්ත්‍රාත්වලට අදාළ ගිවිසුම්පිටපත්420 ක් මුදල් රෙගුලාසි 702 ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතපසුවීමක් හේතුවෙන් ද, මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියා දැනුවත්ව නොසිටීම දහේතුවෙන් සිදුවූවක්බවත්, 2020 වර්ෂයේ සිට අදාළ ගිවිසුම් පිටපත් විගණනය වෙත ලබා දෙන බව. |

## 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 389 | • මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වටිනාකම රු.24,918,073 ක් සඳහා ලියන ලද චෙක්පත් 174 ක් වගකිව යුතු නිලධාරියකු භාරයේ තබා නොගෙන ගිණුම් අංශයෙන් බැහැර විෂයභාර නිලධාරීන් 04 දෙනෙකු වෙත නිකුත් කිරීම සඳහා භාරදී තිබුණි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ඇති බව. |
| (ආ) | 2013 ජුනි 12 දිනැති අංක HAF/01/09/විවිධ දරන රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය | ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මාසික ඉදිරි වැඩසටහන් මාසයේ ආරම්භක දිනට සතියකට පෙර තම ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතු බව දන්වා තිබුණි.එසේ වුවද උකුවෙල ප්‍රාදේශීය | චක්‍රලේඛලිපියපරිදි කටයුතු කළ යුතු වීම. | වරද නිවැරදි කිරීමට ක්ෂේත්‍ර නිලධාරීන් වෙත ලිඛිතව දැනුම් දී ඇති බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | ලේකම් කාර්යාලයේ නිලධාරීන් 17 දෙනෙකු විසින් එලෙස කටයුතු නොකළ අවස්ථා 138 ක් පැවතුණි. | | |
| (ඇ) | 2008 ජුනි 13 දිනැති අංක LD – 1-34- (1) 2008 දරන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ හා 2018මාර්තු 28 දිනැති අංක 01/2018 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | රාජ්‍ය ආයතන සතු ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම හා අවිධිමත්ව බැහැර කිරිම වළක්වාලීම අරමුණු කරගෙන රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම හා අවිධිමත්ව බැහැර කිරිම් පිළිබඳව පූර්ණ වාර්තාවක් සති දෙකකට වරක් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඉකුත් වර්ෂය තුළ ග්‍රාම නිලධාරීන් 57 ක් විසින් එම අවශ්‍යතාවය පරිදි දෙසති වාර්තා 1178 ක් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛයපරිදි කටයුතු කළ යුතු වීම. | ග්‍රාම නිලධාරින්ගෙන් ලබා ගත යුතු වාර්තා අනිවාර්යෙන්ම ලබා ගැනීමට කටයුතු කරන ලෙස සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් දැනුවත් කර ඇති බව. |
| (ඈ) | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පළ කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි xviii පරිච්ඡේදයේරාජ්‍ය නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව විධිවිධාන | එක් ස්ථානයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරු කළයුතු වුව ද උකුවෙල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ වසර 5 ක සිට වසර 13 ක් දක්වා කාල පරාසයක් අඛණ්ඩව සේවය කර ඇති නිලධාරීන් 12 ක් ස්ථාන මාරු වීම්වලට යටත් කර නොතිබුණි. | සේවක අත්‍යෘජ්තිය,ස්ථාන මාරුවීමට අවශ්‍ය වෙනත් නිලධාරියෙකුට අවස්ථාව නොලැබීම හා විවිධ ගැටලු ඇතිවිය හැකි බැවින් චක්‍රලේඛයපරිදි කටයුතු කළ යුතු වීම. | 2020 වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලීම් කර ඇතත්, ස්ථාන මාරුවීම් ලැබී නොමැති බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ3.9.1 මාර්ගෝපදේශය | ප්‍රජා පාදක සංවිධාන සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමේ දී එම සමිතියේ ධාරිතාවය පිළිබඳව සැහීමකට පත්වීමකින් තොරව යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වටිනාකම රු.1,917,000ක කොන්ත්‍රාත් 06ක් ප්‍රජා පාදක සංවිධාන 06 ක් සඳහා ලබා දී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | සංවර්ධන කටයුතු විහාරාධිපති හිමියන්ගේ ඉල්ලීම පරිදි ලියාපදිංචි විහාරස්ථ දායක සභාව වෙත හෝ වසම තුළ පිහිටි වෙනත් සමිතියක් වෙත කොන්ත්‍රාත්තුව පිරිනමන ලද බවත් එහිදී සමිති වල මූල්‍ය හැකියාවට වඩා ප්‍රජාදායකත්වය කෙරෙහි අවධානය යොමු කළ බව. |
| (ඊ) | 2019 ජුලි 09 දිනැති අංක GIR /2019/3V(INS &CIR) දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලිපියෙහි අංක 03 ඡේදය | එකතු කළ අගය මත බදු වටිනාකම රු.43,690,882 ක් පිළිබඳ විස්තර කාර්තුව අවසන් වී ඊළඟ මස 15 දිනට පෙර ඉදිරිපත් නොකර මාස 3½ කසිට මාස 10 ක් දක්වා කාල පමාවක් සහිතව ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛයපරිදි කටයුතු කළ යුතුවීම. | ඉදිරියේ දී ප්‍රමාදයකින් තොරව එම වාර්තා යැවීමට කටයුතු කරන බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා මූලධන වියදම් වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් සියයට 25ක් එනම් රු.109,500,000 ක් අනිවාර්ය ඉතිරි කිරීම් කළ යුතුය.එසේ වුව ද රු.49,891,722 ක් හෙවත් ප්‍රතිපාදනවලින් සියයට 11 ක් පමණක් ඉතිරි කර තිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළයුතු වීම | 2019 ඔක්තෝබර් 21 දිනැති BD/GPS121/1/1-2018 අංක දරන ලිපිය මගින් සමස්ථ වැය ශීර්ෂය තුළ ඉතිරිවීම් සියයට 15 ක් කළමනාකරණය කර ගත හැකි නම් එය ප්‍රමාණවත් බව ජාතික අය වැය දෙපාර්තමේන්තුව එකඟතාවය ලබා දී ඇති බව. |
| (ආ) | වෙනත් වැය විෂය සඳහා වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. එසේ වුවද වැය විෂය යටතේ ක්‍රියාත්මක ප්‍රජා මූලික හරිත සමාජ ආරම්භ කිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු. 2,700,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. ඉන් වර්ෂය තුළ රු.177,680 ක් ගෙවීම් කර තිබූ අතර රු.1,444,713 ක් සඳහා බැරකම්වලට එළඹීමෙන් ප්‍රතිපාදන උපයෝජනය රු.1,622,393 ක් විය.ඒ අනුව ඉතිරිය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 40 ක් හෙවත් රු.1,077,607ක් විය. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙළ කර පරිපූරක ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කළ යුතු වීම | අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයරු. 900,000 ක ප්‍රතිපාදන වෙනස් ආකාරයකින් වියදම් කිරීමට භාණ්ඩාගාරය වෙතින් අනුමැතිය ඉල්ලුම් කළත් ඊට අනුමැතිය නොලැබීමහා යටවත්ත ප්‍රාදේශීය ලේකම් විසින් අනුමැතිය සඳහා ඉදිරිපත් කළ රු:425,000 ක් වූ ව්‍යාපෘති වාර්තාව අනුමතනොකිරීම මේ සඳහා හේතු වූ බව. |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සැසඳුම් ප්‍රකාශනය ප්‍රකාරව විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය, වැඩ තහනම් කළ හා මියගිය නිලධාරින්ගෙන් අයවීම් හිඟහිටිව තිබුණු අත්තිකාරම් ශේෂවල එකතුව රු.512,606 ක් වූ අතර, එම හිඟහිටි ශේෂය මාස 03 ක සිට වර්ෂ 18 ක් දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1 ඡේදයේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | අදාළ ණය ශේෂ පෞද්ගලික ලිපිගොණුවල ගැටලු නිරවුල් වූ විගස අය කර ගැනීමට, විශ්‍රාම වැටුප් පාරිතෝශික ගෙවීමේදී අය කර ගැනීමට, වාරික වශයෙන් අය කර ගැනීමට හා නීතිමය පියවර ගැනීම තුළින් අය කර ගැනීමට කටයුතු කරන බව. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක වැය විෂයයන් 21 කට අදාළව ජනාධිපති ලේකම් කාර්යාලය ඇතුළු අමාත්‍යාංශ 13 ක් හා දෙපාර්තමේන්තුවක් මඟින්ලබා දුන් රු. 18,611,604 ක ප්‍රතිපාදනයන් සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබුණි. | ප්‍රතිපාදන නියමිත පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | 2019 දෙසැම්බර් 31 දක්වා අතැති බිල්පත් රු. 11,073,017 ක් වන බවත්, ඉතිරි ප්‍රතිපාදනය වන රු.7,538,587 ක් අක්මුදල් නොමැතිවීම නිසා ඉතිරිවී ඇති බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට,ජනාධිපති ලේකම් කාර්යාලය ඇතුළු අමාත්‍යාංශ14 කින් හා දෙපාර්තමේන්තු 06 කින් මූලධන වියදම් සඳහා ලබාදුන්පිළිවෙලින් රු.1,208,261,130 ක හා රු.3,116,220 ක ප්‍රතිපාදනවලින් සියයට 10 කසිටසියයට 99 ක් දක්වා පරාසයක් තුළ පිළිවෙලින් රු.446,213,716 ක් හා රු.1,639,375 ක් ලෙස එකතුව රු.447,853,135 ක ප්‍රතිපාදන ඌන උපයෝජනය කර තිබුණි. | ප්‍රතිපාදන නියමිත පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | භාණ්ඩාගරය විසින් ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා අග්‍රිම නිකුත් නොකෙරුණු බවත්, 2019 දෙසැම්බර් 31 දිනට අතැති බිල්පත්රු.507,885,681ක්පවතින බව. |
| (ඇ) | මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන | | |
| | • දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය විසින් මිලදී ගෙන පෞද්ගලික මෝල් හිමියන් වෙත ලබාදුන් වී තොග සහල් කිරීමෙන් අනතුරුව සතොස ආයතනයට ලබාදීමේ ක්‍රියාවලියේ දී රු.3,970,842 ක් වටිනා සහල් කි.ග්‍රෑම් 69979.5 ක් වූ තොග සතොස ආයතනය වෙත ලබා දීමට කටයුතු කර නොතිබුණි. | එකඟතාවය අනුව සහල් තොග ලබා ගැනීමට හෝ පාඩුව පියවා ගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වීම. | සත්‍ය ලෙසම භාරදීමට ඇති තොගය කි.ග්‍රෑ. 49879.5ක් වන බවත්, දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් වරින් වර දුරකථනයෙන්, ලිපි මඟින් අදාළ පුද්ගලයින් වෙත ද මාතලේ පොලිසිය වෙත ද දැනුම් දී අදාළ පුද්ගලයින් ගෙන්වා ගෙන සාකච්ඡා කරන ලද අතර එහිදි සහල් තොගයේ වටිනාකම ගෙවීමට ඔවුන් එකඟ වූ බව. |
| | • මාතලේ අළුවිහාර රජමහ විහාරය ආශ්‍රිතව හෙළ බොජුන්හලක් ඉදිකිරීම වෙනුවෙන් රු. මි. 12.35 ක් ලැබී ඉන් රු. මි. 4.95 ක් හරවා යැවීමෙන් පසු රඳවාගත් රු.7,410,000 ක ප්‍රතිපාදනයෙන් සියයට 34.1 ක් වූ රු.4,211,587 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | වර්ෂය තුළ අපේක්ෂිත සංවර්ධනව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වීම. | ඉදිකිරීම් සඳහා ලබාගතයුතු විවිධ අමාත්‍යාංශ අනුමැතියන් ලබාදීමට ගතවී ඇති කාලයහා අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව ඉලක්කගත පරිදි සපුරාගැනීමට දැඩි බලපෑම් එල්ලවූ බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් රත්තොටප්‍රාදේශීය ලේකම් කාර්යාලයේනායයාම් හා අධි අවදානම් හේතුවෙන් නැවත පදිංචිකිරීම සඳහා ලද ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.37,491,800 ක වටිනාකමින් වියදම් දරා තිබුණේ රු.14,091,800ක්පමණි. | ප්‍රතිපාදන නියමිත පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | 2019 දෙසැම්බර් 31 දිනට ලියන ලද බිල්පත් සඳහා මුදල් 2020 පළමු කාර්තුව අවසානයේ ලැබීම හේතුවෙන් අපේක්ෂිත සංවර්ධන කාර්යය ප්‍රමාද වූ බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉනාමළුව පුරාණ ගම්මාන (11) ප්‍රවේශය ප්‍රතිසංස්කරණයේදී තණ පිඩලි ඇල්ලීම හා එහි නඩත්තු කටයුතු වෙනුවෙන් රු. 81,576 ක් ඇස්තමේන්තු කර තිබුණ ද, එය ඉටු කර නොතිබියදී කර්මාන්තය සඳහා වූ මුළු ඇස්තමේන්තු මුදලමගෙවීමටසහතික කර තිබුණි. | රජයට සිදු වූ පාඩුව අයකර ගත යුතු අතර ඊට වගකිව යුත්තන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වීම. | මෙම ඉදිකිරීම් කටයුතු ඉටු කර ඇති බවත්,එහි නඩත්තු කටයුතු අදාළ පළාත් පාලන ආයතනය විසින් සිදු කළ යුතු බවත්දන්වා ඇත. |

**(ආ) අනුමත නොකළ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ව්‍යාපෘති 2 ක් සඳහාකොන්ත්‍රාත් විචලන නියෝග සඳහාපූර්ව අනුමැතියලබා නොගෙන රු.1,001,342 ක් ගෙවීම් සහතික කර තිබුණි. | විචලන නියෝග ඉදිරිපත් කර පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ගෙවීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතු වීම. | අවශ්‍ය අවස්ථාවලදී විචලන නියෝග ලබාගෙන ඇති බවත් අනුමැතියකින් තොරව කිසිදු ගෙවීමක් සිදුකර නොමැති බව. |
| (ii) | වාසල කෝට්ටේ සමෘද්ධි බැංකුවේ ඉහළමහලයේ අතිරේක වැඩ කොටස් නිමකිරීමවෙනුවෙන් රු.191,316 ක් නිසි අනුමැතියකින් තොරව ගෙවීම් කර තිබුණි. | නිසි අනුමැතියකින් තොරව කටයුතු කිරීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතු වීම හා එම මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අනුමැතියකින් ගෙවීම් කර ඇති බව. |
| (iii) | නකල්ස් සුන්දරත්වය නැරඹුම් කුටිය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුවට ඇතුළත් කර නොතිබූ රු.216,202 ක් වූ වැඩ විෂයන් 9 ක විචලතාවයන් සඳහා පූර්ණ අනුමැතියකින් තොරව ගෙවීම් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව කටයුතු නොකිරීම පිළිබඳ ක්‍රියාමාර්ග ගතයුතු වීම. | වියදම් නිසි අනුමැතිය තුළ සිදු කර ඇති බව. |

(ඇ) **වංචනික ස්වරූපයේ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු. 840,000 ක් වටිනා සෝජි මහන මැෂින් 20 ක් ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘතියක නම භාවිතා කරමින් ව්‍යාජ ලේඛන සකසා පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් වෙත ලබා දී තිබුණි. | වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමට හා ඔවුන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතු වීම. | උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයේ හා ලේඛන නඩත්තු කිරීමේ දුර්වලතා පවතින බව පිළිගන්නා බවත්, දිරාපත් වෙමින් තිබූ සම්පත් උපයෝජනය කර ගැනීමටත් සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගත් පුහුණු ලාභීන්ට සාධාරණයක් ඉටු කිරීමටත් ගත් උත්සාහයක් බව. |
| (ii) | දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ විසින් ප්‍රවාහන හා ඉන්ධන දිමනා රු.137,800 ක් ලබාගෙන තිබිය දී එම කාලය තුළදී කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සඳහා යොදවා තිබූ රජයේ වාහන දෙකක් භාවිතා කර තිබුණි. | රජයට සිදු වූ පාඩුව අයකර ගත යුතු අතර ඊට වගකිව යුතු නිලධාරී සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වීම. | එම වාහන මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකුගේ ඉල්ලීම පරිදි ඔවුන් සඳහා යොදවා තිබූ බවත්, ක්‍රම සම්පාදන අධ්‍යක්ෂක කිසිදු අවස්ථාවක පෞද්ගලිකව භාවිතා කර නොමැති බව හා ඇය වෙනුවෙන් ඉන්ධන සඳහා රජයේ මුදල් වැය කිරීමට කටයුතු නොකලබව. |

(ඈ) **වෙනත්**

පහත සඳහන් නිරීක්ෂණන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ විදුලි සෝපානය සැපයීමෙන් පසු නිෂ්පාදිත වගකීම් සහතිකය ඉදිරිපත් කර නොතිබිය දී ගිවිසුම් | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකර ගෙවීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට හා වැඩිපුර ගෙවූ මුදල් අයකර | පළමු වාරිකය ගෙවීම් කරනු ලබන්නේ විදුලි සෝපානය ආනයන කරන රට වෙනුවෙන් ණයවර ලිපියක් විවෘත කිරීම සඳහා වන |

| | | | |
|---|---|---|---|
| | කොන්දේසිවලටපටහැනිව කොන්ත්‍රාත්කරු වෙත සියයට 50 ක් වූ රු.2,580,600 ක් ගෙවා තිබුණි. | ගැනිමට කටයුතු කළ යුතු වීම. | අතර, මේ වන විට මෙම විදුලි සෝපානය සඳහා සම්පූර්ණ මුදල ගෙවා නොමැති බැවින් අවසන් ගෙවීමට ප්‍රථම යම් දෝෂයක් පවතී නම් එය නිවැරදි කර ගැනීමට උපදෙස් ලබා දුන් බවත් දන්වා ඇත. |
| (ii) | නාඋල ලිහිණිපිටිය ජල ව්‍යාපෘතිය සඳහා සවිකළ රු. 65,000 ක් වූ ජල මෝටරය නාඋල ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා විසින් ගලවාගෙන ගොස් තිබුණ ද ඒ සම්බන්ධයෙන් නිත්‍යානුකූල පියවර ගැනීමෙන් තොරව නැවත රු.375,000 ක වියදමින් නව ජල මෝටරයක් සවිකර තිබුණි. | රජයේ දේපල අවභාවිතය සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කළ යුතු වීම. | ජල මෝටරය ලිහිණිපිටිය ග්‍රාම සංවර්ධන සමිතිය සතුව හෝ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සතුව පවතින බවට අනාවරණය වන බැවින්, නැවත පරීක්ෂණයක් සිදුකර අධිකරණ ක්‍රියාමාර්ගයක් මඟින් හෝ රජය සතු දේපලක් වන මෙම ජල මෝටරය ලබාගැනීමට අවශ්‍ය කටයුතු කර දෙන මෙන් නාඋල පොලිස් ස්ථානාධිපතිවෙත දන්වා ඇති බව. |
| (iii) | මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියකුගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරිම සඳහා රු. 257,386 ක් වූ ගෙවීම ද්‍රව්‍ය පරීක්ෂණ වාර්තාව ලබා ගැනිමෙන් තොරව ගෙවීම් කර තිබුණි. | ද්‍රව්‍ය පරීක්ෂණ වාර්තාව ලබාගෙන ගෙවීම් කිරීම හෝ පරීක්ෂණ වාර්තාව අසමත් වුවහොත් අලාභය අයකර ගැනිමේ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වීම. | ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු අධික වර්ෂා කාලයක් පැවතීමත්විශාල ව්‍යාපෘති සංඛ්‍යාවක් තිබීමත්නිමකළ ව්‍යාපෘති සඳහා බිල්පත්කඩිනමින් ගෙවිය යුතුව තිබීමත් හේතුවෙන් කාර්මික නිලධාරිගේ වාර්තා මත සියයට 25 ක අතරුඳවුම් මුදලක් තබා ගෙන ගෙවීම් කරන ලද බවත් මෙම වර්ෂයේ දී කොන්ක්‍රීට් තත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීමෙන් පසුව සියයට 10 ක අතරුඳවුම් මුදලක් තබා ගෙන ගෙවීම් කටයුතු සිදු කරන බව. |

| | | | |
|---|---|---|---|
| (iv) | උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරගහඇළ ක්‍රීඩාපිටිය අසළ ආපදාවට ලක්වූ පැති බැම්ම ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් අඩුපාඩු පැවතියදී ඒ සඳහා රු.717,855 ක් ගෙවා තිබුණි. | ඇස්තමේන්තු උපදෙස් පරිදි ප්‍රමිතියකට අනුව වැඩ නිම කර නොතිබිය දී ගෙවීම් කර තිබීම සම්බන්ධයෙන් නිලධාරීන් වගකිව යුතු වීම. | අඩුපාඩු නැවත සකස් කිරීම සඳහා කටයුතු කර ඇති බවත්, මින් ඉදිරියට ඉදිකිරීම් වලදී මෙවැනි අඩුපාඩු නොවීම සඳහා දැඩිව අවධානය යොමු කරනු ලබන බව. |
| (v) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් නකල්ස් සුන්දරත්වය නැරඹුම් කුටිය ඉදිකිරීම වෙනුවෙන් සකස්කර තිබූ ප්‍රමාණපත්‍රය (BOQ) නිසි පූර්ව ඇගැයීමකින් තොරව සකස්කිරීම හේතුවෙන් මුල් ඇස්තමේන්තුවේ දක්වා තිබූ වැඩ විෂයයන් 10 කට අදාළව වැඩ ප්‍රමාණය සියයට 3 ක සිට සියයට 100 ක් දක්වා පරාසයකින් සංශෝධිත ඇස්තමේන්තුව මගින් වෙනස්කර තිබුණි. | ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රමාණපත්‍ර සැකසීමේදී ටෙන්ඩර් ඇගැයීමේ කමිටුව මගින් ඇගැයීමක් කර නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම. | ඇස්තමේන්තු සකස් කිරීමෙන් පසු ප්‍රායෝගිකව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ස්ථානීය වෙනස් වීම මත අයිතමයන්ගේ ප්‍රමාණයන් ඉංජිනේරු උපදෙස් මත වෙනස් කර ඇති බව. |
| (vi) | ගම්පෙරළිය වැඩසටහන යටතේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විදුලි සම්බන්ධතා ලබාදීමට අවශ්‍ය මට්ටමේ නිවාස ඉදිකිරීම් කර නොමැති ප්‍රතිලාභීන් 13 දෙනෙකු සඳහා විදුලිය ලබාදීම වෙනුවෙන් රු.376,740 ක් ගෙවා තිබුණි. | අරමුණුගතව ප්‍රතිලාභීන් තෝරා නොගැනීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතු වීම. | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙතින් ලබා දුන් ලේඛනයක් අනුව විදුලිය සඳහා ගෙවීම් කර ඇති බවත්,ඒ වන විට මෙම නිවාස සියල්ලක්ම වැඩ නිමවා නොතිබූ බවත්, මේ වන විට සියළුම ප්‍රතිලාභීන් වෙත විදුලි සම්බන්ධතා ලබා දී අවසන් කර ඇති බව. |

**3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | --------------------------------- |
| (අ) | මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කළ යුතු අනුමත | ව්‍යාපෘති නියමිත දිනට නිමකර, අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සපුරා | අමාත්‍යාංශ ලේකම්ගේ 2019 නොවැම්බර් 20 දිනැති BD/GPS/155/0901/HA දරන |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘති සංඛ්‍යාවෙන් සියයට 26 ක් වන රු. මිලියන 126.158 ක් වූ ව්‍යාපෘති 811 ක් නියමිත කාල රාමුව තුළ වැඩ අවසන් කර නොතිබුණි. | ගැනීම සඳහා සැලැසුම් කළ කාල රාමුව තුළ කටයුතු කළ යුතු වීම. | ලිපිය මඟින් ගිවිසුම් අත්සන් කර නොමැති හා ගිවිසුම් අත්සන් කර වැඩ ආරම්භ කර නොතිබූ ව්‍යාපෘති නතර කිරීමට සිදු වීම, ලී බඩු ලබා ගැනීමට නොහැකි වීම, අක් මුදල් ලැබීම ප්‍රමාද වීම, මැතිවරණ කාල සීමාවක් ප්‍රකාශයට පත් වීම යන හේතූන් මත මෙම ව්‍යාපෘතීන් නිම කිරීමට නොහැකි වූ බව. |
| (ආ) | ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන යටතේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.6,000,000 ක් වූ ව්‍යාපෘති07 ක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණ ද, කර්මාන්ත ඉටුකර නොතිබුණි. | ව්‍යාපෘති නියමිත දිනට නිම කර අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | විගණනයට ලක් වී ඇති ව්‍යාපෘති පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් සකස් කර 2020 සැප්තැම්බර් 17 වන දිනට පෙර ලබා දෙන මෙන් දඹුල්ල ප්‍රාදේශිය ලේකම් දැනුවත් කර ඇති බව දන්වා ඇත. |

**3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නාඋල ලිහිණිපිටිය ජල යෝජනා ක්‍රමය වෙනුවෙන් 2008 සිට 2017 වර්ෂය දක්වා අවස්ථා 06 කදී එකතුව රු.5,769,793 ක් වැය කර ඉදිකිරීම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද එම ව්‍යාපෘතියෙන් කිසිදු ජල පාරිභෝගියකු වෙත ජලය ලබා දී නොතිබුණි. | මුදල් නිදහස් කරන ලද ව්‍යාපෘති මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළයුතු වීම . | කොස්ගොල්ල - ආඳාවල මාර්ගය සංවර්ධනය හා විසල් මාතලේ ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් හේතුවෙන් බෙදා හැරීමේ නළ පද්ධතියට විශාල වශයෙන් හානි සිදුවීම නිසා මෙම ජල යෝජනා ක්‍රමය මඟින් ජනතාවට ජලය බෙදා හැරීමට නොහැකි වූ බවත්,මෙම ජල යෝජනා ක්‍රමය සක්‍රිය කිරීම සඳහා තවදුරටත් ප්‍රතිපාදන යෙදවීමට වඩා විසල් මාතලේ ජල |

| | | | |
|---|---|---|---|
| | | | ව්‍යාපෘතිය සඳහා මෙම ජල නළ, උපාංග හා සවිකිරීම් පවරා දීම වඩා සුදුසු බව. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් මඟින් ගම්පෙරළිය ප්‍රතිපාදන යටතේ තාවකාලික වහල ස්ථිර වහලක් බවට පරිවර්තනය කිරීම සඳහා මිලදී ගෙන තිබූ රු. 555,674 ක සෙවිලි තහඩු හා දැව අපේක්ෂිත අරමුණු කෙරෙහි උපයෝජනයට නොගෙන දිරාපත් වෙමින් පැවතුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රතිලාභීන්ගේ ආර්ථික ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබා දෙන ලද ද්‍රව්‍ය නිවෙස්වල ගොඩ ගසා තිබුණ ද මේ වනවිට වහල සෙවිලි කිරීම් කටයුතු සිදු කර අවසන් බව. |
| (ඇ) | උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති 03 ක් සඳහා රු.2,040,151 ක මුදලක් වැයකර තිබුණ ද එම ව්‍යාපෘති තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | ප්‍රතිපාදන වෙන් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී එම ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු කරා ඵලදායීව යොදවා ගැනීමට කටයුතු කළ යුතු වීම. | **තවලංකොය ජල දිගුව**<br>2020වර්ෂයේ දීජල පොම්පය සවි කර විදුලි සම්බන්ධතාවය ලබා දී ,පවුල් 28 ක් සඳහා පානීය ජලය ලබා දී ඇති බව.<br><br>**තාලිංගාමඩ නාන පිහිල්ල ඉදිකිරීම.**<br>පුද්ගලයෙකුටස්නානය සඳහා ප්‍රමාණවත් ජලය නොමැති බව පිළිගන්නා බවත්, වර්ෂා කාලයේදී ප්‍රමාණවත්ව ජලය පවතින බව.<br><br>**දුඹුකොල පොදු පිහිල්ල සංවර්ධනය කිරීම**<br>මෙම නාන පිහිල්ල වැඩි දියුණු කිරිමෙන් පසු ජනතාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන බව. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2014 වර්ෂයේ සිට 2018 දක්වා වර්ෂයන් තුළ අවස්ථා 06 කදී වැඩසටහන් 05 ක් යටතේ ලබාදී තිබූ එකතුව රු.3,748,000 ක ප්‍රතිපාදන මඟින් රු. 3,685,398 ක් වැයකර යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් කහවත්ත පානීය ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් කර තිබුණි.එසේ වුවද එහි අඩුපාඩු හේතුවෙන් 2019 වර්ෂය අවසානය වන විට ද කිසිදු ජල පාරිභෝගියකු වෙත ජල සැපයුම් ලබා දී නොතිබුණි. | මුදල් නිදහස් කරන ලද ව්‍යාපෘති මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර සැලැසුමකින් තොරව රජයේ මුදල් වැය කිරීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතු වීම. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලීමට අවශ්‍ය ජල ධාරිතාවක් ටැංකි වෙත පොම්ප කරගැනීමට නොහැකි වූ බවත්, මේ සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් නිරන්තරයෙන් දැනුවත් කර ව්‍යාපෘතිය සක්‍රීය කර ගැනීම සඳහා අපමණ උත්සාහයන් දැරූව ද අපේක්ෂිත ප්‍රතිලාභීන් හට ජලය ලබා දීමට නොහැකි වූ බව. |
| (ඉ) | යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාලිගාතැන්න පෞද්ගලික නිවසක් අසළින් යන මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේදී මාර්ග තලය තුළ පැවති ගස් ඉවත් නොකිරීම නිසා මාර්ගයේ පළල පටු වී තිබුණි. තවද ඇතැම් ස්ථාන දැඩි ආනතියකින් යුතුව නිම කර තිබීමත් හේතුවෙන් එම මාර්ගයේ වාහන ධාවනය අපහසු වීම නිසා ඒ සඳහා වැයකළ රු.639,619 ක වියදමෙන් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි. | ඵලදායීව උපයෝජනය කළ නොහැකි ලෙස ඉදිකිරීම සම්බන්ධයෙන් නිලධාරීන් වගකිව යුතු වීම. | අඩි 08 ක පළලකින් යුක්තව කියුබ් 1 ක ලොරියක් ගමන් කළ හැකි ආකාරයෙන් මෙම මාර්ගය ඉදිකර ඇති බව. |

**3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මාතලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ විදුලි සෝපානය සවිකිරීම වෙනුවෙන් රු.2,580,600 ක කොටස් මුදලක් ගෙවා තිබුණ ද එම යන්ත්‍රය සවිකිරීමෙන් තොරව දිගු කාලයක් කාර්යාල පරිශ්‍රය තුළ ගොඩගසා තිබුණි.එම හේතුවෙන් ඇතැම් කොටස්වල මල බැඳී තිබුණි. | මුදල් නිදහස් කිරීමත් සමඟ අදාළ කර්මාන්ත අවසන් කර ගැනීමට කටයුතු කළ යුතු වීම | වර්තමානය වන විට මෙම විදුලි සෝපානය සම්පූර්ණ කර භාවිතයට ගත හැකි තත්වයේ පවතින බවත්, මෙම විදුලි සෝපානය සඳහා සම්පූර්ණ මුදල ගෙවා නොමැති බැවින් අවසන් ගෙවීමට ප්‍රථම යම් දෝෂයක් පවතී නම් එය නිවැරදි කර ගැනීමට උපදෙස් ලබා දුන් බව. |
| (ආ) | සංචාරක සංවර්ධන වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යංශයෙන් ලද ප්‍රතිපාදන යොදාගනිමින් ක්‍රියාත්මක කළ නකල්ස් සුන්දරත්වය අත්විදීමට නැරඹුම් කුටියක් ඉදිකිරීම ව්‍යාපෘතියේ වැඩ නිමකර නොතිබියදී එහි වැඩ අවසන් ලෙස සලකාගිවිසුම් ගත වටිනාකමින් අතරුදවුම් මුදල් සියයට 10 ක් හා විශේෂ රුඳවුම් සියයට5 ක් අඩුකර රු.3,454,435ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම සහතික කර තිබුණි. | ගිවිසුම්ගත කාර්යයන් ඉටු නොකර තිබියදී වැඩ අවසන් ලෙස සලකා ගෙවීම් කිරීම සම්බන්ධයෙන්ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වීම. | දුරේක්ෂ සපයා සවිකිරීම සඳහා සුදුසු ආයතනයක් කොන්ත්‍රාත්කරු සමඟ එක්ව සොයාගැනීමට බොහෝ උත්සහ කළද ඒ සඳහා සැපයුම්කරුවෙකු සොයාගැනීමට නොහැකිවූ බැවින් එම අයිතමය හැර වැඩ අවසන් කළ සෙසු අයිතමයන් සඳහා ගෙවීමට කටයුතු කර ඇති බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගම්පෙරළිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් අඩු ආදායම්ලාභී නිවාසවල වහලය ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් උකුවෙල හා රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක් විසින් රු.39,336,630 ක වියදම් දරා තිබුණ ද එම ව්‍යාපෘති තුළින් අපේක්ෂිත ප්‍රගතියක් ලබා නොතිබුණි. | මුදල් නිදහස් කරන ලද ව්‍යාපෘති මගින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර එසේ නොකිරීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වීම. | අදාළ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය දැව හා මුදුන් ආවරණ නොලැබීම , යුධ හමුදාවේ ශ්‍රමදායකත්වය ලබාගැනීම පිළිබඳව හා , අදාළ සෙවිලි තහඩු මිල ගණන් අතර ගැටළුකාරී තත්ත්වයන් මතුවීමවැනි හේතුන් මත ප්‍රමාණවත් ප්‍රගතියක් ලබාගත නොහැකි වූ බවත් ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට බලාපොරොත්තු වනබව. |

**3.5 පාඩු හා හානි**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ------------ | ------------------------------------ |
| (අ) | දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 හා 2018 වර්ෂයන් සඳහා කාර්යාලය පිරිසිදු කිරීම් කාර්ය වෙනුවෙන් තෝරාගත් කොන්ත්‍රාත්කරු එය නිසි පරිදි ඉටුනොකළබව දන්වා තිබුණ ද එම කොන්ත්‍රාත්කරු අසාදුගත කිරීමට කටයුතු නොකර මිල ගණන් ඉදිරිපත් කර නොතිබූ වෙනත් ආයතනයක් වෙත වැඩි මිලකට ටෙන්ඩරය ලබාදීම හේතුවෙන් 2017 හා 2018වර්ෂයන් සඳහා රු. 228,000 ක පාඩුවක් සිදු වී තිබුණි. | ගිවිසුම අනුව කටයුතු නොකළ ටෙන්ඩර්කරු අසාධු ගතකළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙන් බැහැරව ටෙන්ඩරය ලබාදීම හේතුකොට ගෙන සිදු වූ අලාභය අයකර ගතයුතු වීම හා ඊට වගකිවයුත්තන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතු වීම. | චන්දිම ක්ලීනින් සර්විස් ආයතනයේ සේවාව පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි වූයෙන් ඔවුන්ගේ සේවාව අත්හිටුවා , නැවත මිල ගණන් කැඳවීමකට කටයුතු නොකර මෙයට පෙර කාර්යාලයේ පවිත්‍රතා සේවාව හොඳින් පවත්වාගෙන ගිය ප්‍රදේශයේ ලියාපදිංචි ඒ.ජී.ආර් ක්ලිනින් සර්විස් ආයතනය වෙත 2017 මැයි 01 වන දින සිට කාර්යාලයේ පවිත්‍රතා සේවාව ලබා දීමට ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කළ බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යටිතල පහසුකම් විශේෂ වැඩසටහන යටතේ යෞවන සමාජ2 ක් වෙත ලබාදුන් රු.141,750 ක් වටිනා කායවර්ධන උපකරණ 11 ක ඌනතාවයක් විය. | යෞවන සමාජ වෙත ලබා දෙනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කළ යුතු වීම. | මේ සඳහා විමර්ශන නිලධාරියකු පත්කර විමර්ශනයක් සිදු කෙරෙමින් පවතින බව. |

## 3.6 අනාර්ජික ගනුදෙනු

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | -------------- | --------------------------------- |
| විමධ්‍යගත සංවර්ධන යෝජනා යටතේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එක්සත් දිරිය ලක් වනිතා සංවිධානයටරු.1,400,000 ක් වටිනා ගෘහ භාණ්ඩ ලබාදී තිබුණි. | ලියාපදිංචි සමිති සඳහා ලබා දිය යුතු ආකාරයේ භාණ්ඩ පමණක් ලබා දීමට කටයුතු කළ යුතු වීම. | මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ 2017,2018 සහ 2019 යන වර්ෂවල රු.1,400,000 වටිනාකමක් සහිත උපකරණ එක්සත් දිරිය ලක් වනිතා සංවිධානයට ලබාදුන් බව. |

## 4. මානව සම්පත් කළමනාකරණය

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ------------------------------------ - |
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල 10 ක තනතුරු 21 කට අදාළව නිලධාරීන් 239 දෙනෙකුගේ පුරප්පාඩු පැවතිණි. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුවීම. | වාර්තා සෑම මසකම 15 වන දින හා 30 හෝ 31 දින අදාළ අමාත්‍යාංශය වෙතට යොමු කරන බවත් අදාළ පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්ත නොකිරීම හේතුවී ඇති බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කළමනාකරණසේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන චක්‍රලේඛය අනුව අතිරික්ත කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවිය නොහැක.එසේ වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) තනතුර ඇතුළුව සංවර්ධන නිලධාරීන් 05 දෙනෙකු හා රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් 03 දෙනෙකු අතිරික්තව තබා ගෙන රු. 3,182,515 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | පුරප්පාඩු පවතින කාර්යාල සඳහා අතිරික්ත නිලධාරීන් යෙදවිය යුතු වීම | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය අනුමත කිරීම සඳහා පැවති සමාලෝචනයේ දී සැලැසුම් අංශයට අනුයුක්තව සිටී තනතුරු 10 අනුමත කර ගැනීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත්, එය අනුමත වූ පසු මෙම අතිරික්තතාවය නොපවතින බවත්,<br><br>සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) තනතුර අතිරික්තව පවතින අතර එම තනතුර පුරප්පාඩු පවතින කර්යාලයක් වෙත ස්ථාන මාරු කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. |